**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

නීති කෙටුම්පත් සම්පාදකදෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදකදෙපාර්තමේන්තුවේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරවදෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 15දිනගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පූර්ව අවබෝධයක් සහ සැලසුමකින් තොරවවිදේශිය ගමන් වියදම්වැය විෂය සඳහා රු.1,000,000 ක් වූ ප්‍රතිපාදන ඇති කරගෙන, මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | COVID - 19 වසංගත තත්වය හේතුවෙන් විදේශීය පුහුණු සඳහා නිලධාරීන් සහභාගී නොවූ බැවින් ප්‍රතිපාදනයඋපයෝජනය නොවුනි. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කර ඇත. | වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමේ දී හා මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලකිල්ලෙන් සකසුරුවම් හා පූර්ව අවබෝධයෙන් යුක්තව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

--------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------- | ------------- |
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ කාර්යසාධන වාර්තාව අනුවදෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පහත පරිදි වේ. | පිළිතුරු ලබා දී නොමැත | දෙපාර්තුමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | තමාට සීමා වූ කාර්යභාරයයන්ගෙන් බැහැර වූ කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවට පනත් කෙටුම්පත් පිළිබඳ නිරීක්ෂණ හා උපදෙස් බාහිර පාර්ශවයන් වෙතින් බලාපොරොත්තුවෙන් සිටීමට සිදු වීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපා තිබූ අතර එම ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය බව නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන අතර මනා සම්බන්ධීකරණයක් දැනටමත් පවත්වාගෙන යනු ලැබේ. මෙම තත්ත්වය, ප්‍රධාන වශයෙන්ම උපදෙස් ලබා දෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීම සහ අවසානාත්මක ලෙස අවශ්‍ය උපදෙස් මෙම දෙපාර්තමේන්තුවට ලබා නොදීම නිසා සිදු වන්නක් බව සඳහන් කළ යුතු ය. | ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් දෙපාර්තුමේන්තුවේ කාර්යසාධනය ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතුවේ. |

Table in (අ):

| රාජකාරියේ ස්වභාවය | 2021 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් කිරීම සඳහා වූ මුළු ඉල්ලීම් සංඛ්‍යාව (2021 ජනවාරි 01 ඉදිරියට ගෙනා ශේෂය හා වර්ෂය තුළ ලද නව ඉල්ලීම්) | 2021 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | 2021 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනිකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව | 2021 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ මුළු ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 298 | 29 | 202 | 231 |
| පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් | 30 | 13 | 13 | 26 |
| උපකාරක නීති ප්‍රතිශෝධනය | 453 | 48 | 125 | 173 |
| පළාත් සභා ප්‍රඥප්ති සකස් කිරීම | 10 | 01 | 09 | 10 |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාර්ය අවසන් නොවූ නීති කෙටුම්පත් ගොනු අතර වසර 18 ක සිට පැවත එන ගොනු ද විය. ඉල්ලීම් කෙටුම්පත් කිරීමට හෝ ප්‍රතිශෝධනය කර අවසන් කිරීමට මෙසේ දීර්ඝ කාලයක් ගතවීමෙන් එහි අපේක්ෂිත ප්‍රතිඵලයන්ගේ කාලීන වැදගත් බව අඩුවනවා මෙන්ම, කාලීන අවශ්‍යතාවයන්ට නොගැලපීම හේතුවෙන් එය ප්‍රතිඵලදායක නොවන තත්ත්වයකට පත්විය හැකිව තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිමය තීරණ මත විවිධ අමාත්‍යාංශ හා වෙනත් නියෝජ්‍යායතන වෙතින් ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයහෝ අදාළ නියෝජ්‍යායතන විසින් තවදුරටත් කටයුතු සිදුනොකරන ලෙස දැනුම්දෙනතෙක් හෝ අදාල පනත් පාර්ලිමේන්තුවේ සම්මත වනතෙක් එම ඉල්ලීම් පිළිබඳ ගොනු වසා දැමීමටදෙපාර්තමේන්තුවට හැකියාවක් නැත. මේ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට ගත හැකි විකල්ප පියවරක් ද නොමැත. | කටයුතු නිමකල නොහැකි ගොනු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ. |

**3.2 ප්‍රසම්පාදනයන්**

----------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134"රාජ්‍ය වියදම් සමාලෝචනය" යන මැයෙන් මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබූඅමාත්‍ය මණ්ඩල සංදේශයේ 2(i) අනුව නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද දැනට ආරම්භ කර නොමැති මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටුවිය යුතු බව දක්වා තිබිය දී එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව එකතුව රු.5,116,054 ක් වූ ප්‍රසම්පාදනයන් සමාලෝචිත වර්ෂය අවසානයේසිදු කර තිබුණි. | පුරප්පාඩු පැවති තනතුරු සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීමට අදාළ කටයුතු ආරම්භ කර තිබූ බැවින් රාජකාරි සහ සේවා අවශ්‍යතාවය පිළිබඳ සලකා බලා අදාළ කාර්යාල උපකරණ මිලදී ගැනීම සිදු කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීමට අදාල වැය විෂයේ අයවැයගත ප්‍රතිපාදනය රු.2,000,000 ක් පමණක් වීම නිසාවැය විෂයන් 3 ක ඉතිරි වී තිබූරු.3,201,200 කප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වර්ෂය අවසානයේ මාරු කරගෙන ඉහත ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. | පසුගිය වසර තුළ රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් භාණ්ඩ මිල අධික ලෙස ඉහළයාම නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වෙන් කර තිබූ ප්‍රතිපාදන අදාළ කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් මහාභාණ්ඩාගාරයේ අවසරය ඇතිව ප්‍රතිපාදන මාරුකරගෙන අදාළ මිලදී ගැනීම සිදු කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කල යුතුවේ. |
| (ඇ) | ප්‍රසම්පාදනයන්ට අදාලඑකතුව රු.1,836,700 කභාණ්ඩ 2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබිය දී ඒ සඳහා ගෙවීම් කිරීමට චෙක්පත් ලියා තිබුණි. තවද එම භාණ්ඩ 2021 දෙසැම්බර් 31 දිනට බඩු වට්ටෝරු පොත්වලට ද ඇතුලත් කර තිබුණි. | අදාළ භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත නිශ්චිත වශයෙන්ම සපයනු ලබන බව සැපයුම්කරුවන් තහවුරු කර තිබූ බැවින් එකී භාණ්ඩ බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර චෙක්පත් ලියන ලදී. | මුදල් රෙගුලාසි 135, 136 කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු අතරභාණ්ඩාගාර අනුමැතියකින් තොරව වර්ෂය අවසානයේ මුදල් රඳවා තබා නොගත යුතු වේ. |
| (ඈ) | පසුගිය වර්ෂය අවසානයේදීද ඉහත පරිදි භාණ්ඩ ලැබීමට පෙර එකතුව රු.2,189,612 ක් වූ චෙක්පත් ලියා ඡායා පිටපත් යන්ත්‍රයක්, UPS 18ක් හා පරිඝණක යන්ත්‍ර 10ක් වර්ෂය අවසානයේදී මිලදී ගෙන තිබුණි. | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද ඡායා පිටපත් යන්ත්‍ර දෙක පුස්තකාලයේ සහදෙවන මහලේ ඡායා පිටපත් කාමරයේ ප්‍රයෝජනය සඳහායොදා ගන්නා ලදි. 2020.09.09 දිනැතිව ඉල්ලන ලද පරිගණක යන්ත්‍ර 15 න් 10 ක් ඉකුත් වර්ෂයේ මිලදී ගෙන ඇති අතර 05 ක් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන ඇත.සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන ඇති පරිගණක 03 සහ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 අලුතින් බඳවා ගනු ලබන නිලධාරීන්ගේ ප්‍රයෝජන සඳහා වේ. ගබඩාවේ අබලි UPS යන්ත්‍ර 16 සහ නව පරිගණක යන්ත්‍ර 18 සඳහා UPS යන්ත්‍ර 34 මිලදී ගෙන ඇත. | මුදල් රෙගුලාසි 135, 136 කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු අතරභාණ්ඩාගාර අනුමැතියකින් තොරව වර්ෂය අවසානයේ මුදල් රඳවා තබා නොගත යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව ආයතනයේ වාහන භාර නිලධාරියා විසින් තම භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රයේ ප්‍රකාරව වාහන ලොග් සටහන් පොතක් තබාගෙන, නිතිපතා එහි ලිවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. ඉදිරියේ දී ගමන් පිළිබඳ මාසික සාරාංශය සෑම මසක් අවසානයේ දී ම වාහන ලොග් පොතෙහි. පිටු අංක 58 සටහන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 1645(අ)හා 1646 ප්‍රකාරවකටයුතු කල යුතුවේ. |

| | |
|---|---|
| වර්ෂයේ වාහන 08 කට සිදුව තිබූ හදිසි අනතුරු සටහන් කර නොතිබූ අතර ගමන් පිළිබඳ මාසික සාරාංශය සම්පූර්ණ කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයෙන් ලබා දී ඇති ආකෘතිය ප්‍රකාරව සටහන් කිරීම සිදුකර ඇත. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස අලුත්වැඩියාව සඳහා ආපදා ණයක් ලබාදීමේ දී, ණය ඉල්ලුම්කරු නමින් නිවසක් ඇති බවට සහතිකයක් සහ නිවස අලුත්වැඩියා කිරීමේ වියදම් ඇස්තමේන්තුවක් ලබා නොගෙන අවස්ථා 04 කදී නිවාස අලුත්වැඩියා කිරීම සඳහාඑකතුව රු.812,556 ක ආපදා ණය ලබා දී තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි.මින් ඉදිරියට නිලධාරීන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | අදාල අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුවේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයේ සඳහන් අරමුණු කරා ලඟා වීමට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු/ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වසරේ සිට කටයුතු කරමින් පවතී. | 2030තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයේ සඳහන් පරිදි සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු/ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කල යුතුවේ. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (1) ඡේදය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් අනුමත කර ගෙන ද නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණනයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (1) ඡේදය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කල යුතුවේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 22 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ, පුරප්පාඩු 56 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 38 ක් විය.<br>(i) 2021 පෙබරවාරි 21 දිනට නියමිත සේවා කාලය සම්පූර්ණ කර තිබූ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් 14 දෙනෙක් සිටින බැවින්, ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් 08 කගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම මෙම වාර්තාවේ දිනවන විටත් සිදු කර නොතිබුණි.<br>(ii) භාෂා පරිවර්තක තනතුරු සඳහා උපාධිධාරීන් 07 දෙනෙකු 2021 දෙසැම්බර් 01 දින සිට වසරක කාලයකට සහ පුස්තකාලයාධිපතිනිය 2021 නොවැම්බර් 22 දින සිට 2022 අප්‍රේල් 14 දින දක්වාම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. එසේම අධුනික නිලධාරීන් දෙදෙනෙකු රාජ්‍යපරිපාලන චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව මාස 06 කට බඳවා ගෙන තිබුණි.<br>(iii) නීති කෙටුම්පත් සම්පාදනය අරමුණු කරගත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා ඍජුව දායකත්වය ලබා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ තනතුරු 12 න් තනතුරු 07 ක් සඳහා පුරප්පාඩු 35 ක් පැවැති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි.<br>• දැනට සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ සේවය කරන නිලධාරීන් 14 දෙනෙකු ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා උසස් වීමට සුදුසුකම් සපුරා ඇති බැවින් අනුමත ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු සංඛ්‍යාව 08 සිට 14 දක්වා වැඩි කර දෙන ලෙස ඉල්ලමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇත.<br>• ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ පවතින පුරප්පාඩු 02 පිරවීම සඳහා සුදුසුකම් සපුරන ලද නිලධාරින් නොමැත.<br>• සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ කටයුතු සිදු කරමින් පවතී. | කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුවේ. |
| (ආ) | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම් 01, 02 හා චක්‍රලේඛයේ 6.1 හා 6.5 ඡේද ප්‍රකාරව ඉටු කළයුතු අවශ්‍යතාවයන්, සමාලෝචිත වර්ෂයේ ආයතනය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2022.01.18 දිනැතිව අධිකරණ අමාත්‍යාංශය වෙත යවා ඇත. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |